(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 37]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 නොවැම්බර් මස 08 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0100/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— ක්‍රීඩා සහ පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000 වර්ෂයේ සිට අද දක්වා කාලය තුළ, වාර්ෂිකව —

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයට ලැබුණු සම්පූර්ණ මුදල කොපමණද;

(ii) මණ්ඩලය දැරූ සම්පූර්ණ වියදම කොපමණද;

(iii) එක් එක් වර්ෂයේ වාර්තා වූ අතිරික්තය කොපමණද;

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය ඉපැයූ පොලී ආදායම කොපමණද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් රූපවාහිනී විකාශන අයිතිය ලබා දීම මගින් ඉපැයූ ආදායම කොපමණද සහ එම විකාශන අයිතිය පිරිනමන ලද්දේ කාහටද;

(vi) එම අයිතිය පිරිනැමීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලැබුවේද;

(vii) ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලැබුවේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(viii) ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකළේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන් අයගේ නම් කවරේද;

(ix) ඉහත කී ටෙන්ඩරය හිමි කර ගත් අයගේ දේශීය නියෝජිතයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0101/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු ජනාධිපතිතුමිය විසින් එල්. ටී. ටී. ඊ. සංවිධානය සමග සාම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළේ කවදාද;

(ii) එම ගිවිසුමේ මූලික කරුණු කවරේද;

(iii) සටන් විරාම ගිවිසුම අත්සන් කළේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා ඝාතනයට ලක්ව ඇතැයි වාර්තා වී ඇති පුරවැසියන්, සන්නද්ධ හමුදා සාමාජිකයන් සහ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2008 ජනවාරි මස 03 වැනි දින සටන් විරාම ගිවිසුම අහෝසි කිරීමෙන් පසු ලබා ගත් ප්‍රතිලාභ, ඒ සඳහා ඇති නිවැරදි සාක්ෂි සමගින් කවරේද;

(iii) 2000 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ සන්නද්ධ හමුදා සහ පොලිසිය වෙනුවෙන් වාර්ෂිකව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0102/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර සහ පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට රටෙහි සමස්ත ගෑස් පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිපදවනු ලබන ප්‍රමාණය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 20 පුරා පැවති ගෑස්වල සිල්ලර මිල ගණන් කවරේද;

(iv) පාරිභෝගිකයාට දැරීමට සිදු වී ඇති බර අඩු කිරීමට කිසියම් සහනාධාරයක් දෙනු ලබන්නේද;

(v) එසේ සහනාධාරයක් දෙනු ලබන්නේ නම්, දැනට ලබා දී ඇති සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගෑස් ආනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් නිපදවනු ලබන අවස්ථාවේ සිට පාරිභෝගිකයා වෙත එම ගෑස් ළඟා වන අවස්ථාව දක්වා දැනට ගෑස් මත පනවනු ලබන සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0219/'08

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනතා වතු කළමනාකරණ හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු කළමනාකරණ හා සංවර්ධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0221/'08

5\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0592/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0686/'08

7.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0687/'08

8.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0688/'08

9.

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0698/'08

10.

ගරු සරත් රණවක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු කළුතර බස් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ අධ්‍යක්ෂ මණ්ඩලයට සේවයට වාර්තා කිරීමට ඉඩ දී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඊට බලපෑම් කළ නිලධාරීන් හෝ වෙනත් පුද්ගලයින් කවුරුන්ද;

(iv) අධ්‍යක්ෂ මණ්ඩලයට අවිධිමත් ලෙස වෙනත් අය පත්වූයේද;

(v) එසේ නම්, ඒ කවදාද;

(vi) මෙම පත්වීම් නීත්‍යානුකූල වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) අවිධිමත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට නීත්‍යානුකූල අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්වූයේ නම් එම දිනය හා ඔවුන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) බාධා කිරීම නිසා එම අධ්‍යක්ෂ මණ්ඩලයට සේවයට වාර්තා කිරීමට නොහැකි වූයේද;

(ii) ඔවුන් සේවයට වාර්තා කළේ කවදාද;

(iii) නීත්‍යානුකූල පත්වීම් නොලද අධ්‍යක්ෂවරුන් තවමත් සිටීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0699/’08

11.

ගරු සරත් රණවක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 මහ මැතිවරණයෙන් පසු ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2004.04.27 දිනැති අංක ඊජේ/ටී/204(5) දරන චක්‍රලේඛය හා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් නිකුත් කළ 2004.05.18 දිනැති අංක පීඒ/405/12/පොකුරු, දරන චක්‍රලේඛය සම්බන්ධව එතුමා දන්නෙහිද?

(ආ) එකී චක්‍රලේඛ මගින්, 2004 මහ මැතිවරණයන් පසු ලබාදුන් පත්කිරීම්, උසස්කිරීම් හා මාරුකිරීම් අවලංගු වූ බවට සලකන ලෙස තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවිධිමත් පත්වීම් මේ වන විට නිවැරදි කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නිලධාරීන්ගේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එලෙස පත්වීම් විධිමත් කළ නිලධාරීන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0700/’08

12.

ගරු සරත් රණවක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු කළුතර බස් සමාගමේ හොරණ ඩිපෝවේ පත්වීම් ලබා සිටි ඩිපෝ කළමනාකාර රත්නසිරි ලියනගේ සහ මුදල් කළමනාකාර ජයසේන යන අය, මුදල් වංචාවක් හේතුවෙන් සේවය තහනම් කර තිබේද;

(ii) ඒ කෙදිනක සිටද;

(iii) අදාළ චෝදනාව කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කළුතර බස් සමාගමේ එවකට අනුමත නිලධාරීන් සංඛ්‍යාව තුළ අතිරේක සේවක මණ්ඩල කළමනාකරණ තනතුරක් තිබුණේද;

(ii) නොඑසේ නම්, ඒ කවර නිලධාරියෙක්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) හිටපු මුදල් කළමනාකරු බී. එල්. නිමල් ජයසේකර යන අයගේ සේවය තහනම් කර තිබුණේද;

(ii) එසේ නම්, අදාළ චෝදනාව කවරේද;

(iii) ඔහු නැවත සේවයේ පිහිටුවා තිබේනම් ඒ කවර තනතුරකටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ඉහත ජයසේකර යන අය අවිධිමත් ලෙස අතිරේක සේවක මණ්ඩල කළමනාකරු සහ සේවක මණ්ඩල කළමනාකාර තනතුරු දෙකෙහිම එකවර සේවය කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඉ) (i) වැඩ තහනමකට ලක්ව සිටිය දී සහ අධිකරණයේ නඩුවක් තිබියදී අවිධිමත් ලෙස එකී තනතුරුවලට පත්වී ඇත්නම් එම තනතුරු නීත්‍යානුකූල නොවන බව; සහ

(ii) ඉහත තනතුරු දෙකේ සේවය කළ කාලය තුළ දී ඔහු විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඔහුගේ අත්සනින් යුතුව කළ පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් නීත්‍යානුකූල නොවන බව;

එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0710/’08

13.

ගරු වජිර අබේවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) දෙපාර්තමේන්තු වසා දැමීම හා තනතුරු අහෝසිවීම මත අඩු වයසින් විශ්‍රාම ලැබ ඉන් පසු විවාහ වූ නිලධාරීන්ට ඔවුන්ගේ මනාපය පරිදි දිගටම දායක මුදල් ගෙවා වයස අවුරුදු 55 දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබා දීමට හැකි වන පරිදි අදාළ පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පනතේ සංශෝධන කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර තිබේද;

(iii) වයස අවුරුදු 55ට පෙර විශ්‍රාම ගන්නාවූ සන්නද්ධ සේවාවන්හි සේවයේ නියුතු අයද මෙයට ඇතුළත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම සංශෝධන පනතේ රෙගුලාසි කඩිනමින් ක්‍රියාත්මක කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0711/'08

14.

ගරු වජිර අබේවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, දංගෙදර, සමගිවත්තේ, අංක 264/1 ලිපිනයෙහි පදිංචි එච්. එම්. එම්. මහරූෆ් මහතා 1981-1984 ජනවාර්ගික අරගලය නිසා විපතට පත්වූවන් පිළිබඳව සොයා බැලීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් (ලිපිගොනු අංක: MNBD/PAC/2453) ඉදිරිපත් කරන ලද බවත්;

(ii) එම කොමිෂන් සභාව මගින් අදාළ විමර්ශනයෙන් පසු, වන්දියක් නිර්දේශ කරන ලදුව අදාළ අමාත්‍යාංශය මගින් අංක 901329 දරන 2007.09.28 දිනැති රුපියල් 20,000/- ක් වටිනා චෙක්පත මොහුගේ නමින් නිකුත් කරන ලද බවත්;

(iii) ඊට පෙර, එනම්, 2007.04.28 දින මහරූෆ් මහතා මියගිය හෙයින්, ඔහුගේ බිරිඳ වන හලීමත් සහ්දියා යන අය විසින් ඉහත චෙක්පත හා අදාළ ලිපි ලේඛන 2007.11.22 දින අදාළ අමාත්‍යාංශය වෙත ආපසු යවන ලද බවත්;

(iv) එම වන්දි මුදල් සඳහා නීත්‍යානුකූල හිමිකාරිය වන හලීමත් සහ්දියා යන අය වෙත අදාළ චෙක්පත නිකුත් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මියගිය මහරූෆ් මහතාගේ බිරිඳ වන හලීමත් සහ්දියා යන අයගේ නමින් අදාළ චෙක්පත නිකුත් කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0712/'08

15.

ගරු වජිර අබේවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, මකුළුව අළුත් පාරේ, අංක 40/2 දරන නිවසේ පදිංචි මොහොමඩ් ෆාලිල් මොහොමඩ් මහතා ගාල්ල මහ නගර සභාවේ කම්කරුවෙක් ලෙස සේවය කරමින් සිටියදී අනතුරකින් මියගිය බවත්;

(ii) ඔහුගේ විශ්‍රාම වැටුප (විශ්‍රාම වැටුප් අංකය 14995) ඔහුගේ බිරිඳ වන මොහොමඩ් සහිඩ්නූර් මුර්පිඩා මහත්මිය විසින් 2001.10.25 වැනි දින ඇය මිය යන තෙක්ම ලබාගත් බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) එම මියගිය දෙපොළගේ බාලවයස්කාර දරුවන් වන පාතුම්මා සිනා සහ මොහොමඩ් වෙසීර් යන දෙදෙනාම අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම් ලාභීන් වන අතර, වැඩිමහල් දැරිය වන පාතුම්මා සීනා යන අයට අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය යටතේ, (වැ. අ. වි. වැටුප් අංක 38462 හා වැ. අ. වි. වැටුප් අංක 2575), 2005.05.19 වැනි දින දක්වා විශ්‍රාම වැටුප් මුදල් ලබා දී තිබුණද මීළඟට එම මුදලට හිමිකම් ඇති මොහොමඩ් වෙසීර් යන අයට විශ්‍රාම වැටුප් මුදල ලබාදීම මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බව එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය යටතේ 2006.02.14 වැනි දින සිට විශ්‍රාම වැටුප් හිමිකම් ලාභී මොහොමඩ් වෙසීර් යන අයට හිමි විශ්‍රාම වැටුප් මුදල නොපමාව ලබා දීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහි ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (දෙවැනි වෙන්කළ දිනය)— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (නොවැම්බර් 06) [1]

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

උප සභාපති

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 12.000.00 | මාසික |
| | එකතුව | රු. | 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 1,000,000,000<br>680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 3,800,000,000<br>3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.<br>රු. | 400,000,000<br>550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*13.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*14.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*15.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*17.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*20.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*23.
අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*24.
ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*25.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*26.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*27.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*28.
සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*29.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

30.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.